# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1983/4 – 2016 සැප්තැම්බර් 05 වැනි සඳුදා – 2016.09.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේස්සරම් පත්තුව සුළු කොට්ඨාසයේ, තිත්තකඩේ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක PU/CHL/2015/012 හා 2015.02.17 දිනැති ප්‍රගමන අනුරේඛනයෙහි පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – දේවාලවත්ත – ප්‍රමාණය: හෙක්. 1.1123

උතුරට: කේ. රත්නකයිලාසනාදර් කුරුක්කාල් හිමිකම් කියන තිත්තකඩේවෙල (හිපි 154001); නැගෙනහිරට: එස්. ඒ. සෝමා විජේසිංහ හිමිකම් කියන පොල්මැස්සවත්ත (හිපි 154001); දකුණට: මාර්ග (මා.සං.අ.); බටහිරට: එස්. ජයසිංහ හිමිකම් කියන මොලඑලිකට්ටුව, 6504 වෙනි මූලික පිඹුරේ කැබලි අංක 1 සහ පු 312 වෙනි මූලික පිඹුරේ කැබලි අංක 1.

ජෝන්. ඒ. ඊ. අමරතුංග
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4/3/15/2014/වීර්/270.
2016 මාර්තු මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 768